# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION


| මගේ අංකය / எனது இல. / My Ref. | SASA/2022/A/54 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.07.10 |
|---|---|---|---|---|---|

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කථානායක,
ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා.

<u>යෝජිත අන්තර්වාර පාලනය සාර්ථක කරගැනීම සඳහා අනිවාර්යෙන්ම ක්‍රියාත්මක කළ යුතු කරුණු</u>

නිර්පාක්ෂික ජනතා අරගලයේ උච්චතම අවස්ථාව සනිටුහන් වන මෙම මොහොතේ ශ්‍රී ලංකාවේ අනාගත පාලනය උදෙසා සකස් වන යාන්ත්‍රණය නිවැරදි මාවතකට ගෙන ඒම සඳහා පහත සඳහන් යෝජනාවන් අනිවාර්යෙන්ම ක්‍රියාත්මක කළ යුතු බව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය තරයේම අවධාරණය කර සිටිමු.

1. පිහිටුවීමට නියමිත අන්තර්වාර රජය උපරිම වශයෙන් කැබිනට් අමාත්‍යවරුන් 15දෙනකුගෙන් පමණක් සමන්විත විය යුතුය. ( ඇමුණුම 01)
2. බිඳවැටී ඇති ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා විෂයය ප්‍රාමාණික/ ප්‍රායෝගික වෘත්තීයවේදීන් ජාතික ලැයිස්තුව මගින් ව්‍යවස්ථාදායකය වෙත පත් කොට ආර්ථිකය හා සම්බන්ධ අමාත්‍යධුරයන්හි වගකීම් ලබා දීම.
3. ජනාධිපතිවරයා හා අගමැතිවරයාගේ කාර්ය මණ්ඩලය ඉතා අවම සංඛ්‍යාවක් දක්වා අඩු කළ යුතුය.
4. කැබිනට් අමාත්‍යවරයෙකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය පෞද්ගලික ලේකම්වරයකුට පමණක් සීමා විය යුතුය.
5. අමාත්‍යාංශ ලේකම්වරුන් ලෙස පත් කළ යුත්තේ සක්‍රීය සේවයේ නියුතු පූර්වයෙන් විනය දඬුවම් ලබා නොමැති හා දැනට විනය ක්‍රියාමාර්ගවලට යටත් කොට නොමැති ජ්‍යෙෂ්ඨ සිවිල් රාජ්‍ය නිලධාරීන් පමණි.
6. දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් ලෙස පත් කළ යුත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය සහිත උපලේඛනගත තනතුරුවලට අදාළ සක්‍රීය සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් පමණි.
7. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට සභාපතිවරු ඇතුළු නිලධාරීන් විධිමත් ක්‍රමවේදයකට අනුව පත් කළ යුතුය. (නුසුදුසු පුද්ගලයින් දේශපාලන හිතවත්කම් මත පත් නොකළ යුතුය) සක්‍රීය සේවයේ යෙදී සිටින රාජ්‍ය නිලධාරීන් අතුරින් සුදුසු පුද්ගලයන් තෝරා පත් කිරීමෙන් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ අතිරේක වැය බරක් දැරීමට සිදු නොවනු ඇත.


**23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.** 23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**
දුරකතනය/ தொலைபேசி/**Telephone : 011 5766855** ෆැක්ස්/தொலைநகல்/ **Fax : 011 2058027**
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ **Email : sasa.execo@gmail.com** වෙබ් අඩවිය/இணையத்தளம்/ **Web: www.sasa.lk**

8. පළාත්පාලන ආයතනවල සභිකයන්ගේ ධුර කාලය ව්‍යවස්ථානුකූලව අවසන්ව ඇති බැවින් අධික පිරිවැයක් දරමින් ඔවුන් නඩත්තු නොකොට එම ආයතන නොපමාව විසිරුවා හැරීමට කටයුතු කළ යුතුය.

9. භාණ්ඩාගාරයට අධික වැයබරක් වෙමින් නඩත්තු වන ක්‍රියාත්මක තලයේ නොමැති පාඩු ලබන රාජ්‍ය ආයතන වහාම ඇවරකිරීමට කටයුතු කළ යුතුය.

10. අධික කුලී හෝ බදු පදනමින් පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ රජයේ ගොඩනැගිලිවල ස්ථාපිත කළ යුතුය.

11. පූර්වයෙන් පැවති රාජ්‍ය අමාත්‍යාංශයන්හි විෂයය පථයයන් හා කාර්ය මණ්ඩල අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත වහාම යොමු කළ යුතුය.

12. පවත්නා ආර්ථික අර්බුදය හමුවේ ආන්තීකරණයට ලක් වී ඇති ජනතාව වෙත සහන සලසමින් පුරවැසි අපේක්ෂාවන් ඉටු වන පිරිමැසුම්දායක විසර්ජන පනත් කෙටුම්පතක් සකසා අනුමැතිය සඳහා වහාම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

මෙම ව්‍යුහාත්මක වෙනස්කම් ආරම්භයේදීම සිදු නොකරන අන්තර්වාර රජයකින් මහජනතාව බලාපොරොත්තු වන අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීමට නොහැකි වන අතර එය විදේශ ණය කළමනාකරණය කර ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගැනීමට සූදානම් වන මාණ්ඩලික නිලධාරී මට්ටමේ එකඟතාවයට ද අහිතකරව බලපානු ඇත.

එබැවින් ස්වාධීන රාජ්‍ය සේවාවක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වූ ජනතා අභිලාශයන් හා ඉල්ලීම් ඉටුකොට ජන ජීවිතය පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය ආහාර, විදුලිය, ගෑස් හා ඉන්ධන ඇතුළු මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමුඛතාව ලබා දී ස්ථාවර රජයක් බිහි කිරීම සඳහා සවිමත් අඩිතාලමක් දැමීමට ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

**පදුල ශ්‍රී රෝහණ ද සිල්වා**
ගරු සභාපති

**ප්‍රදීප් ලක්ශාන්ත**
ගරු ලේකම්

පිටපත්;

1. සියලුම දේශපාලන පක්ෂ නායකයන්
2. සියලුම වෘත්තීය සමිති හා සිවිල් සංවිධාන
3. සියලුම මාධ්‍ය ආයතන ප්‍රධානීන්